[illegible] චක්‍රලේඛ අංක : 12/2011

මගේ අංකය බ/12/13
මුදල් හා ගිණුම් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2011/06/23

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ
සහකාර අධිකාරී වරුන් වෙත

<u>සිරකරු සුභසාධක අරමුදල 2012 වර්ෂය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම .</u>

ඉහත අරමුදල සම්බන්ධයෙන් සෑම වර්ෂයක් සඳහාම අයවැය ලේඛණයක් පිළියෙල කර පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු ඇමතිතුමා වෙත සහ මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු බවට මහා භාණ්ඩාගාරය විසින් දන්වා ඇත.එබැවින් පහත දැක්වෙන සටහන අනුව 2012 මුදල් වර්ෂය සඳහා අයවැය ලේඛණයක් පිළියෙල කර බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන මෙන් දන්වමි.එකී අයවැය ලේඛණයට 2012 වර්ෂය තුළ මෙම අරමුදලට බැර වශයෙන් බලාපොරොත්තු වන ලැබීම්ද අරමුදලින් දැරීමට බලාපොරොත්තු වන වියදම්ද ඇතුලත් කළ යුතුය.

අරමුදලේ ලැබීම් වශයෙන් වර්ෂය තුළ ලැබීම් වල සත්‍ය තත්වයට ආසන්න වන අයුරින් ලැබීම් ඇස්තමේන්තුව පිළියල කළ යුතුය.එම 2012 වසර සඳහා ලැබීම් හා ගෙවීම් ඇස්තමේන්තුව ("ඒ"ආකෘතිය )මගින් පිළියෙල කළ යුතු අතර 2010ජූලි සිට දෙසැම්බර් දක්වාද ,2011 ජනවාරි සිට ජූනි දක්වාද ලැබීම් වල හා ගෙවීම් වල සත්‍ය තත්වය ("බී"ආකෘතිය )මගින් පිළියෙලකර එවිය යුතුය.තවද මෙම ඇස්තමේන්තුව සැකසීමේදී පවතින සත්‍ය වියදමට වඩා විචලනය 20% ඉක්මවයිනම් මුලු විචලනය සඳහා විස්තරාත්මකව වියදම් විස්තර ලබා දීමට කටයුතු කරන්න.

2012 වර්ෂය සඳහා මෙම අය වැය ඇස්තමේන්තුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යැවිය යුතු බැවින් 2011 ජූලි 16 වන දිනට පෙර ඔබගේ අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර බන්ධනාගාර කොමසාරිස් සුභසාධක වෙතට පිටපතක්ද සහිතව බන්ධනාගාර කොමසාරිස් මුදල් වෙත ඉදිරිපත් කරන මෙන් දන්වමි.මා විසින් මෙම ඇස්තමේන්තුව ඉල්ලා එවා ඇති දිනය ඉකුත් වීමට මත්තෙන් ඔබගේ අය වැය ඇස්තමේන්තුව පිළියෙල කර නොපමාව එවීමට වග බලා ගත යුතුය.කෙසේ වෙතත් මෙම ඇස්තමේන්තුව 2011 ජූලි 16 දිනට පෙර මූලස්ථානයේ ගිණුම් අංශය වෙත ලැබීමට සැලැස්වීම අත්‍යවශ්‍ය බැවි තවදුරටත් දන්වා සිටිමි.

මෙම ඇස්තමේන්තුව කළට වෙලාවට ඉදිරිපත් නොකරන හා 2012 වර්ෂයේ වැය කිරීමට බලාපොරොත්තු වන වියදම් මීට ඇතුලත් කර නොමැති ආයතන වලට 2012 වර්ෂය සඳහා මෙම අරමුදලින් ප්‍රතිපාදන වෙන් කර නොදෙන බවද සැලකිය යුතුය.තවද මෙම ගිණුම පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් වූ සියළු උපදෙස් මගේ අංක අංක සී / බී / එල් / 6 හා 1977/11/16 දිනැති අංක 56/77 දරණ චක්‍රලේඛය හා මගේ අංක සී/බී/එල්/32 හා 1987/03/20 දිනැති අංක 559 සංශෝධිත චක්‍රලේඛය මගින්ද ඔබ වෙත නිකුත් කොට ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස ද මෙයින් උපදෙස් දෙමි.

2012 වාර්ෂික වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමේදී වියදම් ශීර්ෂ අංක 1 සිට 6 දක්වා සඳහන් කරනු ලබන අපේක්ෂිත වියදම් මුදල 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාර සැලසුම් වලට අනුකූල විය යුතුය. 2012 ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇති වියදම් හැර ඇස්තමේන්තුවට පරිබාහිරව වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ලබා නොදෙන බව ද දන්වමි.

වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිපී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත : බන්ධනාගාර කොමසාරිස් - සුභ සාධක
නියෝජ්‍ය කොමසාරිස් - අභ්‍යන්තර විගණන

(බී - ආකෘතිය)

සිරකරු සුභසාධක අරමුදල

2012 වර්ෂය සදහා ඇස්තමේන්තුව

| 2012 වර්ෂය තුළ බලාපොරොත්තු වන ලැබීම් (අය) | | 2012 වර්ෂය තුළ වියදම් කිරීමට බලාපොරොත්තු වන මුදල (වැය) | |
|---|---|---|---|
| 01. විනෝද භාණ්ඩ වලින් 1/6 කොටස | | 01. අධ්‍යාත්මික හා ආගමික කටයුතු සදහා වියදම් | |
| 02. සිර වේතන අනිවාර්ය අයකිරීම් වලින් | | 02. අධ්‍යාපන හා සුභ සාධක කටයුතු සදහා වියදම් | |
| 03. මහජන පරිත්‍යාග වලින් ලත් මුදල් | | 03.සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් සදහා වූ වියදම් | |
| 04. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් | | 04. සිරකරුවන්ට ත්‍යාග දීම සදහා වූ වියදම් | |
| 05. සිරකරුවන් වෙත තිබී අයුටු නීති විරෝධී මුදල් | | 05. සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු සදහා වූ වියදම් | |
| 06. බන්ධනාගාර භූමිය තුළ තිබී හසුවූ නීති විරෝධී මුදල් | | 06. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | |
| 07. වෙළඳසැල් වලින් ලැබූ ලාභ මුදල් | | | |
| 08. ප්‍රදර්ශන වලින් ලැබූ ලාභ මුදල් | | | |
| 09. ආපන ශාලා වලින් ලැබූ ලාභ මුදල් | | | |
| 10. වෙනත් දායක මුදල් | | | |
| 11. හිමිකම් පානු නොලැබ තිබූ මුදල් | | | |
| 12. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම් ) | | | |
| ලැබීම් එකතුව | | ගෙවීම් එකතුව | |

(බි.ආකෘතිය)

2011 වර්ෂයේ සිරකරු සුභසාධක අරමුදලේ අයවැය ඇස්තමේන්තුව සඳහා වූ පසුගිය දත්ත සටහන

| 2012 වර්ෂය තුළ බලාපොරොත්තු වන ලැබීම් (අය) | 2010/07/01 සිට 2010/12/31 දක්වා | 2011/01/01 සිට 2011/06/30 දක්වා | 2012 වර්ෂය තුළ වියදම් කිරීමට බලාපොරොත්තු වන මුදල (වැය) | 2010/07/01 සිට 2010/12/31 දක්වා | 2011/01/01 සිට 2011/06/30 දක්වා |
|---|---|---|---|---|---|
| 01. විනෝද භාණ්ඩ වලින් 1/6 කොටස | | | 01. අධ්‍යාත්මික හා ආගමික කටයුතු සඳහා වියදම් | | |
| 02. සිර වේතන අනිවාර්ය අයකිරීම් වලින් | | | 02. අධ්‍යාපන හා සුභ සාධක කටයුතු සඳහා වියදම් | | |
| 03. මහජන පරිත්‍යාග වලින් ලත් මුදල් | | | 03.සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් සඳහා වූ වියදම් | | |
| 04. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් | | | 04. සිරකරුවන්ට ත්‍යාග දීම සඳහා වූ වියදම් | | |
| 05. සිරකරුවන් වෙත තිබී අසුවූ නීති විරෝධී මුදල් | | | 05. සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු සඳහා වූ වියදම් | | |
| 06. බන්ධනාගාර භූමිය තුළ තිබී හසුවූ නීති විරෝධී මුදල් | | | 06. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | | |
| 07. වෙළඳසැල් වලින් ලැබූ ලාභ මුදල් | | | | | |
| 08. ප්‍රදර්ශන වලින් ලැබූ ලාභ මුදල් | | | | | |
| 09. ආපන ශාලා වලින් ලැබූ ලාභ මුදල් | | | | | |
| 10. වෙනත් දායක මුදල් | | | | | |
| 11. හිමිකම් පානු නොලැබ තිබූ මුදල් | | | | | |
| 12. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම් ) | | | | | |
| ලැබීම් එකතුව | | | ගෙවීම් එකතුව | | |